# තක්කාලි වගාවේ බදුල්ල ප්‍රදේශයට විශේෂිත පෝෂක කළමනාකරණය

## හැඳින්වීම :

එළවළු වගාව දේශීය කෘෂිකර්මාන්තයේ ඉතා වැදගත් කොටසකි. වගා කරන බොහෝ එළවළු අතර තක්කාලි ප්‍රධාන බෝගයක් වන අතර ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල වගා කෙරේ. බදුල්ල දිස්ත්‍රික්කය තක්කාලි වගාව සිදු කරන ප්‍රදේශ අතරින් විශේෂ ස්ථානයක් ගනී. සාර්ථක තක්කාලි වගාවක් සඳහා හොඳින් ජලය බැස යන, ලිහිල්, උදාසීන හෝ ආසන්නව උදාසීන, ශාක පෝෂක වලින් පොහොසත් පසක් වඩාත් සුදුසුය. තක්කාලි සඳහා ප්‍රශස්ත pH පරාසය 6.2 සහ 6.8 අතර වේ.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වත්මන් පොහොර නිර්දේශයන් විවෘත පරාගිත එළවළු වගාව සඳහා මූලික මාර්ගෝපදේශයක් සපයයි. එහෙත් වර්තමානයේ බොහෝ ගොවීන් අතර දෙමුහුම් ප්‍රභේද ප්‍රචලිත වී ඇති අතර ඒ සඳහා මෙම පොහොර නිර්දේශය ප්‍රමාණවත් නොවේ. පසෙහි පෝෂක සංයුතිය, pH මට්ටම, තෙතමනය රඳවා තබා ගැනීම සහ ශාක සෞඛ්‍යයට බලපාන අනෙකුත් ලක්ෂණ ප්‍රදේශ අනුව සැලකිය යුතු ලෙස වෙනස් බැවින් සාමාන්‍ය පොහොර නිර්දේශයක් රටේ සියලුම කලාපවල තක්කාලි වගා වල ප්‍රශස්ත වර්ධනයට ඵලදායී ලෙස දායක නොවේ.

මෙම සීමාවන් සපුරාලීම සඳහා බොරලන්ද ප්‍රදේශයේ ගොවීන්ගේ ක්ෂේත්‍රවල ප්‍රදේශයට විශේෂිත පෝෂක කළමනාකරණය පිළිබඳ සිදු කරන ලද පරීක්ෂණ මත පදනම්ව බදුල්ල ප්‍රදේශයේ තක්කාලි වගාව සඳහා ප්‍රදේශයට විශේෂිත පොහොර පැකේජයක් මෙහි දක්වා ඇත.

## විශේෂිත වූ පොහොර පැකේජය:

බදුල්ල ප්‍රදේශයේ බහුලව දක්නට ලැබෙන පස් වර්ගය රතු කහ පොඩ්සොලික් වන අතර එහි පෝෂක අන්තර්ගත ප්‍රමාණය සහ pH අගය අඩුය. සමස්තයක් වශයෙන්, බදුල්ල ප්‍රදේශයේ පස තරමක් ආම්ලික වන අතර pH අගය 5.0 සහ 6.0 අතර වේ.

පාංශු සාරවත් බව වැඩි දියුණු කිරීම සඳහා, සම්පූර්ණයෙන්ම දිරාපත් වූ කුකුල් පොහොර මිශ්‍ර කල යුතුය. පසට වැඩියෙන් හෝ නැවුම් ලෙස කුකුල් පොහොර යෙදීමෙන් පසෙහි රසායනික ද්‍රව්‍ය සාන්ද්‍රණය අනවශ්‍ය පරිදි ඉහල යාම නිසා බෝගයට විෂ විය හැකි බැවින් නිර්දේශිත ප්‍රමාණය පමණක් යෙදීම මෙන්ම හොඳින් දිරාපත් වූ පොහොර යෙදීම ද ඉතා වැදගත් වේ. වර්ධනය සඳහා ප්‍රශස්ත පාංශු තත්ත්වයන් සහතික කිරීම සඳහා පැල සිටුවීමට දින කීපයකට / සතියකට පෙර මෙම පොහොර යෙදීම උචිත වේ. පොහොර යෙදීමෙන් පසු පොහොර වලින් මුදා හරින රසායනික ද්‍රව්‍ය වල විෂ සහිත බව අවම වීමට මෙම කාලය ඉඩ සලසයි.

ප්‍රශස්ත පෝෂක ලබා ගැනීම සහතික කිරීම සඳහා පැළ සිටුවීමට දිනකට පෙර මූලික පොහොරක් ලෙස ත්‍රිත්ව සුපර් පොස්පේට් (TSP), යූරියා සහ මියුරේට් ඔෆ් පොටෑෂ් (MOP) යෙදීම සිදු කල යුතුය. සිටුවීමට පෙර TSP යෙදීමෙන් එය පසට ඒකාබද්ධ වීමට ඉඩ සැලසෙන අතර ශාක මුල් වර්ධනය වීමට පටන් ගත් පසු එය පහසුවෙන් අවශෝෂණය කර ගත හැකිවේ. විශේෂයෙන් ශාක වර්ධනයේ මුල් අවධියේදී, මූල වර්ධනය සඳහා පොස්පරස් තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි.

බොහෝ වගාවන්වලට දෙමුහුන් ප්‍රභේද භාවිතා කරන බැවින් ඒවාට යොදන යූරියා ප්‍රමාණය සාමාන්‍ය කෘ.දෙ. නිර්දේශයට වඩා සුළු වශයෙන් වැඩිවේ. පවත්වන ලද අත්හදා බැලීම්වලදී තක්කාලි බෝගයට යූරියා වරින්වර යෙදීම සුදුසු බව පෙනේ. MOP යෙදීමද එම අවස්ථාවලදීම සිදුකල යුතුවේ. කැල්සියම් නයිට්‍රේට් ($Ca(NO_3)_2$) යෙදීම මඟින් ශාක වර්ධනයට අත්‍යවශ්‍ය නයිට්‍රජන් සහ කැල්සියම් යන පෝෂකයන් දෙකම සැපයීම කළ හැක. කැල්සියම් මඟින් ශාක සෛල බිත්ති ශක්තිමත් කරන අතර කඳන් සහ පත්‍ර සෞඛ්‍ය සම්පන්නව වර්ධනය කරයි. පලිබෝධ සහ රෝගවලට ප්‍රතිරෝධය වැඩි කරයි. මල් පිපීමේ අවස්ථාවේ සිට පත්‍රමතට සති දෙකෙන් දෙකට මෙය ඉසිය යුතුවේ.

අර්ධ වශයෙන් පිළිස්සුණු දහයියා (PBRH) පසෙහි ව්‍යුහය ද වැඩි දියුණු කරන අතර එහි සිලිකේට් 20% ක් අඩංගු වේ. එය ශාක සෛල ශක්තිමත් කරන අතර රෝග ප්‍රතිරෝධීතාවයද වැඩි දියුණු කරයි.



බදුල්ල ප්‍රදේශයට විශේෂිත පොහොර පැකේජය පහත වගුවේ දැක්වේ.

| පොහොර | යොදන කාලය | | | | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | සිටුවීමට පෙර | මූලික පොහොර | සති 1කට පසු | සති 3කට පසු | සති 5කට පසු | සති 7කට පසු | |
| කුකුල් පොහොර (ටොන්/හෙක්:) | 10 | - | - | - | - | - | 10 |
| TSP (කි.ග්‍රෑ./හෙක්.) | - | 215 | - | - | - | - | 215 |
| Urea (කි.ග්‍රෑ./හෙක්.) | - | 40 | 75 | 58 | 58 | 58 | 289 |
| MOP (කි.ග්‍රෑ./හෙක්.) | - | 25 | 40 | 45 | 45 | 45 | 200 |
| $K^+$ (ජල ද්‍රාව්‍ය) - ලීටර් 16 යේ ඉසින ටැංකියකට ග්‍රෑම් 32 බැගින් හෙක්ටයාරයකට ටැංකි 25 ක් සිටුවා සති 3 කට හා 6 කට පසු බෝගයට (පත්‍ර වලට) ඉසින්න | | | | | | | |
| $Ca(NO_3)_2$ - ලීටර් 16 යේ ඉසින ටැංකියකට ග්‍රෑම් 32 බැගින් හෙක්ටයාරයකට ටැංකි 25 ක් 50% මල් පිපීමේ අවස්ථාවේ සිට සති 2 න් 2 ට බෝගයට (පත්‍ර වලට) ඉසින්න | | | | | | | |
| PBRH (අර්ධ වශයෙන් පිලිස්සූ දහයියා) – පැළයකට ග්‍රෑම් 125 | | | | | | | |

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය එක්ව ක්‍රියාත්මක කරන ශ්‍රී ලංකාව තුළ පලිබෝධනාශක හා පොහොර ආරක්ෂිතව හා නිවැරදි ලෙස භාවිතය ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය මඟින් සකසන ලදී

2025 නොවැම්බර්